# ආයුබෝවන්

# අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගමික හා සාරධර්ම ශාඛාව

# මගින් මෙහෙයවන

# 2022 අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා

# 45 බෞද්ධ ශිෂ්ටාචාරය - උපකාරක සම්මන්ත්‍රණය

කථිකාචාර්ය, ආචාර්ය පූජ්‍ය මැටිබැම්බියේ ධම්මසිරි හිමි

අධ්‍යාපනපති පූජ්‍ය උලහිටියාවේ විභාවි හිමි

ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්ගොල්ලෑවේ සුමනසාර හිමි

කථිකාචාර්ය ආර්.ඩී. ශ්‍රියානි හේමලතා මිය

ගුරු උපදේශක ආර්. ඒ. ගුණවර්ධන මයා

# I පත්‍රය

# උපදෙස්

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට **(1), (2), (3), (4), (5)** යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** උත්තරය තෝරාගෙන එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.

01. වර්ණ යනු පාට, පැහැය යන අර්ථය ලබාදීම සඳහා ව්‍යවහාර කරන්නා වූ වචනයකි. බමුණෝ, බ්‍රහ්ම මුඛ සංකල්පය පදනම් කරගෙන සමාජය කොටස් හතරකට බෙදා වෙන් කළහ. එම චතුර් වර්ණය නැවත ආර්ය හා අනාර්ය වශයෙන් කොටස් දෙකකට වෙන් කළහ. ඒ අතරින් ආර්යයන් ලෙස සැලකෙන්නේ,

(1) බ්‍රාහ්මණ වර්ණයයි.

(2) බ්‍රාහ්මණ හා ක්ෂත්‍රිය වර්ණයයි.

(3) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය වර්ණයි.

(4) බ්‍රාහ්මණ, වෛශ්‍ය වර්ණයි.

(5) ශුද්‍ර වර්ණයයි.

02. බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් සමාජය කොටස් හතරකට බෙදා දැක්වූවා පමණක් නොව, පුද්ගල ජීවිතය ද කොටස් හතරකට වෙන් කරන ලදී. එය චතුර් ආශ්‍රම ධර්ම නම් වේ. එම ආශ්‍රම ධර්මවලින් ''සන්න්‍යාසි'' අවධියේ දී කළ යුතු කාර්යයක් වන්නේ,

(1) සියලු ම ලෞකික දෙයින් ඈත්ව අනගාරික හුදකලා සංචාරක ජීවිතයක් ගත කිරීමයි.
(2) බ්‍රහ්මචාරීව ගුරුවරයාගේ කාර්යයන් ඉටු කරමින් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමයි.
(3) අඹුදරුවන් පෝෂණය කරමින් පස්කම් සැප විඳිමින් කාමභෝගී ජීවිතයක් ගත කිරීමයි.
(4) ලෞකික ආශාවන්ගෙන් වෙන්ව, තවුස්දම් රැකුම සඳහා වන ගත වීමයි.
(5) දිවි ඇති තාක් බ්‍රහ්මචාරීව කටයුතු කිරීමයි.

03. පහත දැක්වෙන චතුර් වර්ණයට පැවරුණු ස්වධර්ම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A - ඉගැන්වීම, යාග කරවීම, දන් පිළිගැනීම, බමුණු වර්ණයට අයත් කාර්යයන් ය.

B - ඉගෙනීම, යාග කිරීම, දන් දීම පමණක් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණවලට පැවරුණු කාර්යයන් වේ.

C - කාම සම්පත්තියේ නො ඇලී කටයුතු කිරීම බ්‍රාහ්මණයන්ගේ කාර්යයකි.

D - උසස් කුලයන්ට බැලමෙහෙවර කිරීම ශුද්‍ර වර්ණයට අයත් කාර්යයකි.

E - ප්‍රජා පාලනය ක්ෂත්‍රිය වර්ණයට අයත් කාර්යයකි.

ඉහත ප්‍රකාශ අතරෙන් **සාවද්‍ය ප්‍රකාශ** දෙක වන්නේ,

(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E (5) C හා E

04. ''පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් නොබිඳෙන ස්ථිර වූ සප්ත පදාර්ථයක් ඇත.'' යනුවෙන් ඉගැන් වූ බුද්ධකාලීන ශාස්තෘවරයා කවුරුන් ද?

(1) පූර්ණ කාශ්‍යප

(2) මක්ඛලී ගෝසාල

(3) අජිත කේසකම්බල

(4) පකුධ කච්චායන

(5) නිගණ්ඨනාතපුත්ත

05. පහත දැක්වෙනුයේ ශ්‍රමණ හා බ්‍රාහ්මණ සංස්කෘතීන් තුළ දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයකි.

**A -** කර්ම මාර්ගය පිළිගැනීම
**B -** අගාරික ප්‍රතිපදාව පිළිගැනීම
**C -** චින්තන නිදහස අගය කිරීම
**D -** ඥාන මාර්ගය පිළිගැනීම
E - අනගාරික ප්‍රතිපදාව පිළිගැනීම

මෙයින් බ්‍රාහ්මණ සම්ප්‍රදායට අනන්‍ය වූ ලක්ෂණ ඇතුළත් වන්නේ,

(1) A, වල පමණි.
(2) A, B වල පමණි.
(3) A, B, C වල පමණි.
(4) A, B, C, D වල පමණි.
(5) A, B,C, D සහ E යන සියල්ලෙහි ය.

06. සොළොස් මහා ජනපද අතරින් වේභාර, වේපුල්ල, ගිජ්ජකූට, ඉසිගිලි හා පාණ්ඩව යන පර්වතයන්ගෙන් සමන්විත වීම නිසා එම රාජ්‍ය "ගිරිබ්බජ" නමින් ඇතැම් අවස්ථාවන්හි ව්‍යවහාර විය. එම රාජ්‍ය කුමක් ද?

(1) අංග

(2) මගධ

(3) කෝසල

(4) අවන්ති

(5) වජ්ජි

07. බුද්ධකාලීන භාරතයේ කෘෂිකාර්මික කටයුතුවල බ්‍රාහ්මණයන් පවා නිරතව සිටි බව .................. සූත්‍රයේ දැක්වේ.

(1) අග්ගඤ්ඤ

(2) චක්කවත්ති සීහනාද

(3) උපාලි

(4) අස්සලායන

(5) කසීභාරද්වාජ

08. ''සිත සමාධියට පැමිණි කල්හි, නුවණ ඇති කල්හි දහම් ඇති සැටියෙන් දකින්නහුට ස්ත්‍රී භාවයකින් කුමක් කරන්න ද?'' යනුවෙන් විමුක්තිය සාධනය විෂයයෙහි ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව ප්‍රකාශ කළේ,

(1) පටාචාරා තෙරණියයි.

(2) ඛේමා තෙරණියයි.

(3) ප්‍රජාපතී ගෝතමී තෙරණියයි.

(4) සෝමා තෙරණියයි.

(5) නන්දා තෙරණියයි.

09. යහපත් කොට යෙතැයි
සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි

.......................................................

යන පද්‍යයෙන් විස්තර වන බුදුගුණය වන්නේ කුමක් ද?

(1) අරහං
(2) සුගත
(3) ලෝකවිදූ
(4) භගවා
(5) බුද්ධ

10. "ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති" යනුවෙන් පැහැදිලි වන බුදුරජාණන් වහන්සේ සතු සුවිශේෂ ගුණයක් වන්නේ,

(1) මහා කරුණාවයි.

(2) මහා ප්‍රඥාවයි.

(3) <u>තාදි ගුණයයි.</u>

(4) විශිෂ්ට ශාස්තෘත්වයයි.

(5) නිදහස් චින්තනයයි.

11. පහත දැක්වෙනුයේ බුදුරජාණන් වහන්සේ පිළිබඳව සමකාලීනව සිදු කළ ඇගයීමකි."භවත් ගෞතමයන් වහන්සේ කුළවත්, ධනවත්, රූමත්, වෘද්ධ කාමාශා දුරු කළ විශාල පිරිසකගේ ආචාර්යවරයෙකි. එතුමන් දෙව් මිනිසුනට පවා දහම් දෙසන කොසොල් රජුගේ ගෞරවාදරයට පාත්‍ර වූ කෙනෙකි."
මෙම ඇගයීම සිදු කරනු ලැබුවේ,

(1) ඕපසාද ගමේ සිටි චංකි බමුණා ය.

(2) කේසපුත්තයේ සිටි කාලාමවරු ය.

(3) කක්කරපත්ත ගමේ සිටි දීඝජාණු ප්‍රත්‍රයා ය.

(4) චම්පා නුවර සිටි සෝණදණ්ඩ බමුණා ය.

(5) සැවැත්නුවර සිටි අනේපිඬු සිටුතුමන් ය.

12. පහත සඳහන් වන්නේ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A - දන් දීමෙහි ඇලුණු උපාසිකාවන් අතර අග තනතුරු ලැබීම

B - සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්ම චර්යාව අනුගමනය කිරීම

C - කොසොල් රජු විමසන ලද ප්‍රශ්නවලට දක්ෂ ලෙස පිළිතුරු දීම

D - මදුරට සාගල නුවර මද්දව රජුගේ දියණියක වීම

E - සිතින්වත් සිය සැමියා ඉක්මවා නොයෑම

මෙම ප්‍රකාශ අතුරෙන් නකුල මාතාව පිළිබඳ නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ,

(1) A හා B

(2) B හා C

(3) B හා E

(4) C හා D

(5) A හා E

13. "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන ධම්මපද ගාථාව තුළින් වඩාත් අර්ථවත් කරනුයේ,

(1) බුදු දහමෙහි දැක්වෙන චින්තන හා විමංශන නිදහසයි.

(2) බුදුදහමෙහි දැක්වෙන පුද්ගල ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව සම්බන්ධවයි.

(3) බුදුදහමෙහි දැක්වෙන ආගමික සහනශීලිත්වය සම්බන්ධවයි.

(4) බුදුදහමෙහි දැක්වෙන පරාර්ථචර්යාව සම්බන්ධවයි.

(5) බුදුදහමෙහි දැක්වෙන කර්ම විපාක සම්බන්ධවයි.

14. දසරාජධර්ම සර්වකාලීන වටිනාකමකින් යුත් පාලන මූලධර්මයක් ලෙස සැලකේ. එහි පවත්නා එකිනෙක ධර්ම කරුණු විමසා බැලීමෙන් එය පැහැදිලි වේ. ඒ අනුව මහජනයා සමඟත්, විදේශ රජුන් සමඟත් නො ගැටී සහයෝගයෙන් ක්‍රියා කිරීම අයත් වන්නේ,

(1) ඉවසීමට ය.

(2) ක්‍රෝධ නො කිරීමට ය.

(3) ඍජු බවට ය.

(4) විරුද්ධ නොවීමට ය.

(5) අවිහිංසාවට ය.

15. "සාර්ථක රාජ්‍ය පාලකයකු වීමට අවශ්‍ය සුදුසුකම් මාලාවක් කූටදන්ත සූත්‍රයෙහි දැක්වේ. එයින් කිහිපයක් පහත දැක්වෙන වර්ණයන්හි දැක්වේ. එක් වර්ණයක් එයට අදාළ නොවේ. එම වරණය තෝරන්න.

(1) ප්‍රසාදය එළවන සුලු තැනැත්තකු වීම

(2) මව්පිය දෙපසින් අභිජාත පිළිගත් තැනැත්තෙකු වීම

(3) යහපත් තෙපුල් ඇත්තෙකු වීම

(4) නුවණැත්තෙකු හා උගතෙකු වීම

(5) සහයෝගයෙන් ක්‍රියා කරන්නෙකු වීම

16. පුද්ගල හා සමාජ සංවර්ධනයෙහි ලා හිරි ඔත්තප්ප නම් වූ සාරධර්මයට හිමිවන්නේ සුවිශේෂ වැදගත්කමකි. මෙහි "හිරි" යනු පවට ඇති ලජ්ජාවයි. "ඔත්තප්ප" යනු පවට ඇති බියයි. පාපයට බියවීමට හේතුවන කරුණු හතරක් දහමෙහි දැක්වේ. එම හතරට අයත් **නොවන්නේ** මින් කුමක්ද?

(1) කරන ලද පාපකාරී ක්‍රියා නිසා තමාට පසුතැවිලිවීමට සිදුවේය යන බිය
(2) කරන ලද පාපකාරී ක්‍රියා නිසා අනුන්ගේ දෝෂාරෝපණයට ලක්වේය යන බිය
(3) කරන ලද පාපකාරී ක්‍රියාවනට දඬුවම් ලැබේය යන බිය
(4) කරන ලද පාපකාරී ක්‍රියාවනට අපාගත සිදුවීමට සිදුවේය යන බිය
(5) කරන ලද පාපකාරී ක්‍රියා නිසා අනුන්ට පසුතැවිලි වීමට සිදුවේය යන බිය

17. අර්ථචර්යාව යනු අභිවෘද්ධිය සැලසීමයි. එනම්, තම නෑදෑ හිතමිතුරන්ගේ දියුණුව, සමාජයේ අභිවෘද්ධිය පිණිස ශ්‍රමය, ධනය, කාලය කැප කිරීමයි. එකී මූලධර්මය අයත් වන්නේ,

(1) දස සක්විතිවත්වලට ය.

(3) සතර බ්‍රහ්ම විහරණවලට ය.

(5) සතර අගතිවලට ය.

(2) දසරාජ ධර්මවලට ය.

(4) සතරසංග්‍රහ වස්තුවලට ය.

18. තෙරුවන් කෙරෙහි පැහැදිම ශ්‍රද්ධාව ලෙස සරලව දැක්විය හැකියි. එවන් ශ්‍රද්ධාවෙන් කටයුතු කරන තැනැත්තෙකු තුළ පවත්නා ලක්ෂණ අතරට අයත් **නොවන්නේ,**

(1) ධර්මය ඇසීමට ඇති කැමැත්ත ය.

(3) සිල්වතුන් දැකීමට ඇති කැමැත්ත ය.

(5) මසුරු බවින් තොර පරිත්‍යාගශීලී බව ය.

(2) සිල්වත් බව ය.

(4) කරුණාවෙන් යුක්ත වීම ය.

19 දස අකුසල කර්මයන්හි එන “අභිජ්ඣාව” හෙවත් “අභිධ්‍යාව” යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) අනුන් බිඳවන කේලාම් කීමයි.
(2) දැඩි තරහවෙන් යුක්ත වීමයි.
(3) දැඩි ලෝභයෙන් යුක්ත වීමයි.
(4) දැඩි වෛරයයි.
(5) වැරදි දෘෂ්ටියෙන් යුක්ත වීමයි.

20 "මනරම් තුරුලතාවෝ සුපිපි මලින් පරිසරය සුවඳවත් කරති. පරණ පත් සලා නව සුමුදු පතින් සැරසුණු තුරුලතාවෝ පල දැරීමට කල්බලා සිටිති. වීරයාණෙනි නික්ම යාමට මේ ඉතා සුදුසු ම කාලයයි." පරිසරයේ පවත්නා සුන්දරත්වය මේ ආකාරයට වර්ණනා කරනු ලැබුවේ,

(1) සප්පක තෙරුන් විසිනි.

(2) වනවච්ඡ තෙරුන් විසිනි.

(3) කාළුදායි තෙරුන් විසිනි.

(4) තාලපුට තෙරුන් විසිනි.

(5) මහාකස්සප තෙරුන් විසිනි.

21. ජීව අජීව පරිසරය මිනිසා ඇතුළු සියලු සත්ත්වයන්ගේ යහපැවැත්මට බෙහෙවින්ම බලපාන බැවින් බුද්ධිමත් මිනිසා එය ආරක්‍ෂා කරගැනීමට යොමු විය යුතුය. බුදුරජාණන් වහන්සේ ජීව අජීව පරිසරයේ ආරක්‍ෂාවට ඉදිරිපත් කළ ඉගැන්වීම් රැසක් සූත්‍ර පිටකය තුළ අන්තර්ගතව ඇත.

**A** - කරණීයමෙත්ත සූත්‍රය **B** - ව්‍යග්ඝපජ්ජ සූත්‍රය **C** - වනරෝපා සූත්‍රය

**D** - සාමඤ්ඤඵල සූත්‍රය **E** - කාලාම සූත්‍රය **F** - අනණ සූත්‍රය

ඉහත දැක්වෙන සූත්‍ර අතරින් පරිසරය සුරක්‍ෂිතතාවට අදාළ කරගත හැකි සූත්‍ර දැක්වෙනුයේ,

(1) A, B, D, වලය.
(2) A, B, C වලය.
(3) A, C, D වලය.
(4) C, D, E වලය.
(5) B, C, E වලය.

22. ධන පරිහරණයට අදාළ කරුණු හතරක් රාසිය ගාමිණී සූත්‍රය දැක්වේ. එම හතරට ඇතුළත් නොවන්නේ මින් කුමක් ද?

(1) දැහැමින් ඉපැයීම

(2) තමා සැපවත්වීම

(3) පරිත්‍යාග කිරීම

(4) රජයට බදුගෙවීම

(5) ගිජුකමින් තොරව ධනය පරිහරණය කිරීම

23 මනා කළමනාකරණයකින් යුතුව ධනය පරිහරණය කිරීම තුළින් ඇතිවන ආර්ථික ගැටළු අවම කර ගත හැකි බව උගන්වයි. එම කළමනාකරණයට අයත් වැදගත් ඉගැන්වීමක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දේශනා කර තිබේ. එම ඉගැන්වීම හඳුන්වන්නේ,

(1) සමජීවිකතාව ලෙසයි.
(2) ආරක්ඛ පටිපදාව ලෙසයි.
(3) කල්‍යාණ චින්තනය ලෙයි
(4) උට්ඨාන පටිපදාව ලෙසයි
(5) සද්ධා සම්පදාව ලෙසයි.

24. කණ්ඩායමක අරමුණු හා පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා දක්ෂ හා විචක්ෂණ ලෙස භෞතික හා මානව සම්පත් ඵලදායීව යොදා ගැනීම කළමනාකරණය ලෙස අර්ථ දැක්විය හැකිය. බුදුසමය තුළ ද විධිමත් කළමනාකරණ ක්‍රමවේද භාවිත කර ඇති බව මූලාශ්‍රයගත තොරතුරුවලින් අනාවරණය වේ. බුදුරදුන් අනුදත් සාංඝික දේපළ ක්‍රමය ද සාර්ථක කළමනාකරණ සිද්ධාන්තයක් ලෙස හඳුනාගත හැකි අතර එය,

(1) මානව සම්පත් කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

(2) ආධ්‍යාත්මික කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

(3) භෞතික සම්පත් කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

(4) පිරිස් කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

(5) පරිසර කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

25. පුද්ගල හා සමාජ සදාචාරය ගොඩනැගීමට අදාළව ඉදිරිපත් කර ඇති සූත්‍ර ධර්ම අතර සිගාලෝවාද සූත්‍රයට ප්‍රමුඛත්වයක් හිමිවේ. එහි සඳහන් සදිසා සංකල්පය තුළින් එක් එක් සමාජ කණ්ඩායම් ඉදිරිපත් කළ යුතු යුතුකම් හා වගකීම් දැක්වේ. ඒ අනුව ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටුවිය යුතුකමක් වන්නේ,

(1) පවින් වැළැක්වීම

(2) යහපතෙහි යෙදවීම

(3) නොදත් දේ කියාදීම

(4) හොඳ සිතින් අනුකම්පා කිරීම

(5) මනාව හික්මවීම

26. "විකාල විසිඛාචරියානු යෝගෝ" මෙයින් කියවෙන්නේ,

(1) රහමෙර පානය යි.

(2) නොකල්හි වීථි සංචාරය යි.

(3) නාට්‍ය දර්ශන සඳහා යාම යි.

(4) දූ කෙළියෙහි යෙදීම යි.

(5) පාප මිත්‍ර සේවනය යි.

27. ත්‍රිපිටකාගත ඉගැන්වීම් තුළ මංගල හා පරාභව සූත්‍ර ඇතුළත් වන්නේ,

(1) දීඝ නිකායට ය.

(2) මජ්ඣිම නිකායට ය.

(3) සංයුක්ත නිකායට ය.

(4) අංගුත්තර නිකායට ය.

(5) ඛුද්දක නිකායට ය.

28. පෙර කළ පිං ඇති බව නිසා ම ශාන්තට ස්ථිර පදිංචියට ඉතා සුදුසු ම ප්‍රදේශයක නිවස තනා ගැනීමට හැකි විය. ඔහු තම මව හා පියා මනාව පෝෂණය කරමින් අඹුදරුවන්ට ද සංග්‍රහ කරමින් ධාර්මික රැකියාවක් කළේය. ශ්‍රමණයන් වහන්සේලා දැකීමට බොහෝ ප්‍රිය කළ ශාන්ත උන්වහන්සේලා සමග ධර්ම සාකච්ඡා ද සිදුකරයි. ශාන්තගේ දිවි පැවැත්ම තුළ මංගල සූත්‍රයට අනුව මංගල කරුණු කොපමණ තිබේ ද?

(1) 08කි. (2) 07කි. (3) 10කි. (4) 11කි. (5) 09කි.

29. බුදුරජාණන් වහන්සේ ඡන්න තෙරුන්ගේ වැරදි හැසිරීම් හා නොමනා ප්‍රකාශයන් පදනම් කරගෙන තමන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව ආනන්ද හිමියන් අමතා ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය නිර්දේශ කරමින් දේශනා කළ ධම්මපද ගාථාව වන්නේ,

(1) "නිධීනංව පවත්තාරං - යං පස්සේ වජ්ජදස්සිනං ........" යන ගාථාව ය.

(2) "න භජේ පාපකේ මිත්තේ - න භජේ පුරිසාධමේ ........" යන ගාථාව ය.

(3) "සහස්සමපි චේ වාචා - අනත්ථපදසංහිතා ........" යන ගාථාව ය.

(4) "න පරේසං විලෝමානි - න පරේසං කතාකතං ........" යන ගාථාව ය.

(5) "මධුවා මඤ්ඤති බාලෝ - යාව පාපං න පච්චති ........" යන ගාථාව ය.

30. "මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස ලෝකයාට අනුකම්පා පිණිස ධර්ම චාරිකාව් යෙදෙන්න." යනුවෙන් පළමු රහතන් වහන්සේලා හැට අමතා උපදේශයන් ලබා දී බුදුරදුන් ද ධර්ම ප්‍රචාරය සඳහා ............................ වැඩම කරන ලදී.

(1) රජගහනුවරට
(2) බරණැසට
(3) උරුවෙල් දනව්වට
(4) පසල් දනව්වට
(5) කිඹුල්වතට

31. ප්‍රථම ධර්ම සංගායනාව සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) පළමු සංගායනාව මාස අටක් මුළුල්ලේ පවත්වන ලදී.

(2) පළමු සංගායනාවේ දී මුලින්ම සංගායනාවට ගැනුනේ විනය යි.

(3) සංයුක්ත නිකාය භාර වූයේ සැරියුත් තෙරුන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට යි.

(4) පළමු සංගායනාවට කොසැඹෑනුවර ඝෝෂිතාරාමයේ සිදුවීම ද ආසන්න හේතුවක් ලෙස සැලකේ.

(5) දුර්මතධාරී භික්ෂූන් සසුනෙන් බැහැර කිරීම ද පළමු සංගායනාවේ ප්‍රතිඵලයකි.

32 පහත දැක්වෙනුයේ ථෙරවාදී ධර්ම සංගායනා පිළිබඳ තොරතුරු කිහිපයකි.

A - කථාවත්ථුප්පකරණය අභිධර්ම පිටකයට ඇතුළත් වීම

B - නවරට සසුන් පිහිටුවීම

C - හත්සීයක භික්ෂු පිරිසක් සහභාගිවීම

D - උබ්බාහිකාවක් පත් කිරීම

E - මොග්ගලී පුත්තතෙරුන් වහන්සේ මූලිකත්වය ගැනීම

F - භානක තෙරුන් වහන්සේලා පත්කිරීම

මෙයින් තෙවන සංගායනාවට අදාළව ඉදිරිපත් වී ඇති තොරතුරු දැක්වෙන්නේ

(1) A, C, D වලය.

(2) B, D, E වලය.

(3) D, E, F වලය.

(4) A, B, E වලය.

(5) C, D, E වලය.

33 විශාලාවේ චාරිකාවේ යෙදුණු කාකණ්ඩ පුත්‍ර යස හිමියන්ට වජ්ජි පුත්තක භික්ෂූන් වහන්සේලා විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන විනය විරෝධී දසවස්තුවක් පිළිබඳව දැන ගන්නට ලැබුණි. උන්වහන්සේට එම දසවස්තුව අතුරින් මුලින් ම දැනගන්නට ලැබුණේ,

(1) සිංගිලෝණ කප්පයයි.

(2) ජාත රූප රජත කප්පයයි.

(3) ද්වංගුල කප්පයයි.

(4) ජලෝගි කප්පයයි.

(5) ආවාස කප්පයයි.

34. ක්‍රි. ව. 983 - 995 අතර කාලය තුළ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ ද්වාර පණ්ඩිතවරුන් ලෙස සේවය කළ අයගෙන් ප්‍රඥාකරමති පඬිතුමන්ට භාර වූයේ,

(1) පෙරදිග දොරටුව
(2) උතුරු දොරටුව
(3) පළමුවන දොරටුව
(4) බටහිර දොරටුව
(5) දකුණු දොරටුව

35. මහායාන බුදුසමයට සම්බන්ධ වියත් මහඩිවරුන් කිහිප දෙනෙකුගේ නම් පහත දැක්වේ.

A - වසුමිත්‍ර හිමි B - පාර්ශ්ව හිමි
C - නාගර්ජුණ හිමි D - අශ්වඝෝෂ හිමි
E - බෝධිධර්ම හිමි

මේ හිමිවරු අතරින් කණිෂ්ක රජතුමාගේ රාජ සභාව නියෝජනය කරන හිමිවරුන් ඇතුළත් වනුයේ,

(1) A වල පමණි.
(2) A සහ B වල පමණි.
(3) A, B සහ C වල පමණි.
(4) A, B, C සහ D වල පමණි.
(5) A, B, C, D සහ E යන සියල්ලෙහි පමණි.

36. පණ්ඩුකාභය රජතුමා විවිධ ආගමිකයින් සඳහා විවිධ අනුග්‍රහයන් දක්වා ඇත. ඒ අනුව සොත්ථිශාලා නම් ශාලා විශේෂයක් මෙතුමා කිසියම් ආගමික පිරිසකට කර දුන් බව මහාවංශයේ සඳහන් වේ. ඒවා කර දී ඇත්තේ,

(1) ශිව ආගමික පිරිස් සඳහා ය.

(2) ජෛන ආගමික පිරිස් සඳහා ය.

(3) ආජීවක ආගමික පිරිස් සඳහා ය.

(4) පරිබ්‍රාජක ආගමික පිරිස් සඳහා ය.

(5) බ්‍රාහ්මණ ආගමික පිරිස් සඳහා ය.

37. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළ වකවානුවේ පටන් මේ දක්වා ම මෙරට බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ බවට උතුම් දළදා වහන්සේ පත්ව ඒ වෙනුවෙන් විවිධ පූජාවිධි පැවැත්වීමට බෞද්ධයින් පෙළඹී ඇත. මුලින්ම දළදා පූජා පැවැත්වීම ආරම්භ කරණු ලැබුවේ,

(1) මහාවිහාරය විසිනි.

(2) ජේතවනය විසිනි.

(3) දක්ඛිණගිරිය විසිනි.

(4) අභයගිරිය විසිනි.

(5) චේතියගිරිය විසිනි.

38. බුදුදහම මෙරට ලැබීමෙන් අනතුරුව මෙරට සංස්කෘතිය දහමට අනුව ගෙඩනැගුණි. එම සංස්කෘතිය තුළින් සාරධර්ම රැසක් ජන ජීවිතයට උරුම විය. පරෝපකාරය ඒ අතරින් එක් සංස්කෘතිකාංගයකි. අත්තම් ක්‍රමය පරෝපකාරයේ ප්‍රමුඛ ලක්ෂණයකි. අත්තම් ක්‍රමය යනු,

(1) වැඩිහිටියන් බලා ගැනීම යි.

(2) ගිලානෝපස්ථානය යි.

(3) ආගන්තුක සත්කාරය යි.

(4) ධන සම්පත් නැති බැරි අයට බෙදාදීම යි.

(5) ශ්‍රමය සාමූහිකව බෙදාගෙන කටයුතු කිරීම යි.

39. පහත දැක්වෙනුයේ බුදුදහමේ උන්නතිය සඳහා බෞද්ධ පාලකයින් විසින් ගොඩනගන ලද පූජනීය ස්ථාන කිහිපයකි.

A - දක්ඛිණගිරි විහාරය
B - තිස්සමහා විහාරය
C - අභයගිරි විහාරය
D - ඉසුරුමුණි විහාරය
E - හත්ථාල්හක මෙහෙණවර
F - ලෝවාමහාපාය

මෙම පූජනීය ස්ථාන අතරින් දේවානම්පියතිස්ස රජතුමන් විසින් ගොඩනගන ලද නිර්මාණ ඇතුළත් වන්නේ,

(1) B, C වලය.
(2) C, E වලය.
(3) A, B , D වලය.
(4) B, D, E වලය.
(5) C, D වලය.

40. බුරුමයට ස්ථිර වශයෙන් බුදුදහම ලැබී එය තහවුරු වූ කාලය වශයෙන් සැලකෙන්නේ,

(1) ක්‍රි.ව. 08 වන සියවසේදී ය.

(2) ක්‍රි.ව. 09 වන සියවසේදී ය.

(3) ක්‍රි.ව. 10 වන සියවසේදී ය.

(4) ක්‍රි.ව. 11 වන සියවසේදී ය.

(5) ක්‍රි.ව. 12 වන සියවසේදී ය.

41. ජපානයේ නරා යුගයේ ඇති වූ ප්‍රධාන සම්ප්‍රදායක් වශයෙන් සැලකිය හැකි වන්නේ,

(1) තියෙන්ටයි නිකායයි.
(2) සුඛාවතී ව්‍යුහ සම්ප්‍රදායි.
(3) විනය සම්ප්‍රදායයි.
(4) සද්ධර්මපුණ්ඩරීක සම්ප්‍රදායයි.
(5) චාන් සම්ප්‍රදායයි.

42. ථායිලන්ත බුදුසමයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ක්‍රි.පූ. 329 දී නකොම් පඨොම් නගරය ආශ්‍රිත ව ථේරවාදී බුද්ධධර්මය ව්‍යාප්ත විය.

(2) ක්‍රි.ව. 700 දී පලම්භාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුද්ධධර්මය ව්‍යාප්ත විය.

(3) ක්‍රි.ව. 11 වන සියවසේදී බුරුම පාලක අනෞරථ රජුගේ අනුග්‍රහයෙන් බුද්ධ ධර්මය ව්‍යාප්ත විය.

(4) ක්‍රි.ව. 11 වන සියවසට පෙර පේගු හා ථෙටෝන් රාජධානිවල බුද්ධධර්මය ව්‍යාප්ත විය.

(5) ක්‍රි.ව. 1361 දී ශ්‍රී සූර්යවංශ රාම මහාධාර්මික රජුගේ අනුග්‍රහයෙන් ධර්ම විනය ඉගෙනීමට ලංකාවට එවූ භික්ෂූන් මාර්ගයෙන් බුද්ධධර්මය ව්‍යාප්ත විය.

43. චීනයේ මාධ්‍යමික සම්ප්‍රදායේ ගුරුවරයා ලෙස සැලකෙනුයේ කුමාරජීව පඬිවරයා ය. එතුමාගේ සංස්කෘත හා චීන භාෂාව පිළිබඳ හසල දැනුම එරට බුදු දහමේ ව්‍යාප්තිය සඳහා මහඟු පිටුවහලක් විය. එතුමන් විසින් විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කළ අතර ඇතැම් ඒවා චීන බසට පරිවර්තනය කොට ඇත. එසේ පරිවර්තනය කළ කෘතීන් අතර සුවිශේෂි කෘතියක් වන්නේ,

(1) අභිධර්මකෝෂ ව්‍යාඛ්‍යා ශාස්ත්‍රය

(2) අෂ්ටාදශ සූන්‍යතා ශාස්ත්‍රය

(3) මහා රත්නකූට සූත්‍රය

(4) සන්ධිනිර්මෝචන සූත්‍රය

(5) <u>සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය</u>

44. ඇතැම් සාහිත්‍යාගත මූලාශ්‍රයවලට අනුව බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේදී ම බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වී තිබේ. කොසොල් රජතුමා සඳුන් ලී අරටුවකින් බුද්ධ ප්‍රතිමාවක් නිමවා වැඳුම් පිදුම් කළ බව සඳහන් වන්නේ,

(1) සමන්තපාසාදිකාවේ ය.

(2) වංසත්ථප්පකාසිනියේ ය.

(3) කෝසලබිම්බවර්ණනාවේ ය.

(4) දිව්‍යාවදානයේ ය.

(5) මහාවංසයේ ය.

45. ලාංකේය ස්තූපයේ ඒ ඒ අංගවලට අදාළ ව විවිධ අර්ථ නිරූපණය කර ඇත. ඒ අනුව ගර්භයෙන් නිරූපණය වන්නේ,

(1) සත්තිස් බෝධි පාක්ෂික ධර්ම ය.

(2) නවාංග සත්ථු ශාසනය ය.

(3) චතුරාර්ය සත්‍යය ය.

(4) දිව්‍ය ලෝක හෝ සතරවරම් දෙවිවරු ය.

(5) සුවාසූදහසක් ධර්මස්කන්ධ ය.

46. ඉපැරණි ප්‍රතිමාඝර ප්‍රධාන වශයෙන් ආකාර තුනකින් යුක්ත වේ. ඒ අනුව ..........................ගන්ධ කුටි ක්‍රමයට අයත් වේ.

(1) අනුරාධපුර කිරිබත් වෙහෙර පිළිමගෙය
(2) පොළොන්නරුවේ ථූපාරාමය
(3) රත්නප්‍රාසාද ගොඩනැගිල්ල
(4) ලංකාතිලක විහාරය
(5) මැදවෙල විහාරයේ ගොඩනැගිල්ල

47. පැරණි විහාරවල සිතුවම් ඇඳීමේදී තේමා කොටගෙන ඇත්තේ බුද්ධ චරිතය, බෝසත් සිරිත හා ශාසන ඉතිහාසයට අදාළ සිදුවීම් ය. ඒවායෙහි කාමෝද්දීපනය වන ආකාරයේ සිතුවම් නිර්මාණය නොවීමට හේතුව ලෙස සැලකිය හැක්කේ,

(1) බුදුදහම තුළ දාර්ශනික කරුණු අන්තර්ගත නිසා ය.

(2) කාමෝද්දීපනය වන ආකාරයේ සිතුවම් නිර්මාණයට පැරණි කලාකරුවන් අකැමැති වූ නිසා ය.

(3) සිතුවම්කරණය පිළිබඳ භික්ෂූන්ට විනය නීති මගින් සීමා පනවා තිබීම නිසා ය.

(4) විහාරාවල එවැනි සිතුවම් ඇඳීම රාජ නියෝග මගින් තහනම් කර තිබීම නිසා ය.

(5) බැතිමතුන් විසින් ලෞකික සිතුවම්කරණය විවේචනය කළ නිසා ය.

48. සඳකඩපහණේ සංකේත පිළිබඳ විද්වත් මත රැසක් ඉදිරිපත් වී ඇත. ඒ අතරින් එච්. සී. පී. බෙල් මහතාගේ අදහස වන්නේ,

(1) භව චක්‍රය නිරූපණය කරන බවයි.

(2) ගොඩනැගිලි දොරටු සැරසීමට යොදාගත් උපායක් හා පාදෝනියක් බවයි.

(3) චන්ද්‍ර සූර්ය දෙදෙනා පිළිබඳ විශ්වාසයට හා සශ්‍රීකත්වයට සම්බන්ධ බවයි.

(4) එක් පෙළට ගමන් කරන සතුන් හතර දෙනාගෙන් සතර දිශාව සංකේතවත් කරන බවයි.

(5) විකසිත නෙළුම්පත් රටාව ශුද්ධ ස්ථානයකට ඇතුළු වීමේදී බැතිමතුන්ගේ ආත්ම පූජාවෙන් කොටසක්

49. ලෝවැඩ සඟරාව රචනා කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වී ඇත්තේ,

(1) විශාලා මහනුවර තුන්බිය දුරුකිරීමට බුදුරදුන් එහි වැඩම කිරීම වර්ණනා කිරීමයි.

(2) බෝධිසත්ත්වයන් වහන්සේගේ ප්‍රඥා පාරමිතාව පෙන්වීමයි.

(3) පාලි ධර්මය නොදත් ජනතාවට කර්ම පල විපාක සිංහලෙන් පහදා දීම

(4) තමන් ගුරු ද්‍රෝහියකු නොවන බව පෙන්වීමයි.

(5) බුද්ධ චරිතයේ සුවිශේෂී ගුණාංගයන් විවරණය කිරීමයි.

50. බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල පදනම් කරගෙන රචනා වූ ගීතයකි.

(1) සුගත ලෝනා සම්බුද්ධ රාජා .........

(2) අමා දහර දිය ගලා ගලා .........

(3) අඩවන් වූ දෙනෙතින් ගලනා .........

(4) දස බිම්බර මාරසෙනඟ .........

(5) පාරමිතා බල පූජිත පූජිත බුද්ධ දිවාකරයාණෝ .........